# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 14,543 — 1965 ඔක්තෝබර් 26 වැනි අඟහරුවාදා — 1965.10.26

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

## ආණ්ඩුවේ නිවේදන

### ටැලිපෝන් පණිවුඩ නීති විරෝධී බාධාකිරීම්වලට යටත් කිරීම

රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ කටයුතු පිළිබඳ ඇමති, වෝල්ටර් ජොප්රි මොන්ටේගු ජයවික්‍රම වන මම, රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්, ජී. පී. තම්බයියා වන ඔබ, පහත දක්වෙන කටයුතු කිරීමට මේ නිවේදනය මගින් පත් කරමි. ඒ කටයුතු නම් —

(1) (මෙහි මින් මතු "රජයේ ටැලිපෝන් සේවය" සහ "ටැලිපෝන් පණිවුඩ" යනුවෙන් පිළිවෙළින් සඳහන් කරනු ලබන) ලංකාවේ ටැලිපෝන් පණිවුඩ හුවමාරු කිරීම් සඳහා රජය විසින් පිහිටුවනු ලැබ, පවත්වාගෙන යනු ලබන හා ක්‍රියාත්මක කරනු ලබන සේවයෙන් හෝ ඒ මගින් යවනු ලැබූ හෝ සම්ප්‍රේෂණය කරනු ලැබූ පණිවුඩ, 1960 ජනවාරි 1 දින ආරම්භ ව, 1965 සැප්තැම්බර් 30 දින අවසන් වන කාල සීමාව තුළ නීති විරෝධී බාධා කිරීම්වලට යටත් කරන ලද්දේ ද නැති ද යන වග පරීක්ෂා කොට වාර්තා කිරීම සහ එ සේ නම්—

(අ) එ සේ නීති විරෝධී ලෙස බාධා කිරීම සාර්ථක කර ගනු ලැබූ මාර්ග හෝ උපක්‍රම සහ විශේෂයෙන්, රජයේ ටැලිපෝන් සේවය සලස්වා දීම සඳහා පාවිච්චි කරනු ලැබූ උපකරණ හෝ ස්ථාන, එ සේ නීති විරෝධී බාධා කිරීම සාර්ථක කර ගැනීමේ කාර්යය සඳහා අයුතු ලෙස උපයෝගී කර ගනු ලැබූ ප්‍රමාණය ;

(ආ) ස්වකීය පෞද්ගලික සේවයන් ප්‍රයෝජනයට ගැනීමට ඉඩ හැරීමෙන් හෝ අන් කවර ලෙසකින් වුව ද විදුලි සන්දේශ නිලධාරීන්, වෙනත් රජයේ නිලධාරීන් හෝ මහජනයා විසින්, සහාය දීමෙන්, නිසොල්මන් ව ඉඩ හැරීමෙන් හෝ සහයෝගය දක්වීමෙන් එ සේ නීති විරෝධී බාධා කිරීම කෙතෙක් දුරට සාර්ථක කර ගනු ලැබුයේ ද යන වග හා ඒ නිලධාරීන්ගේ හෝ පුද්ගලයන්ගේ නම් ; සහ

(ඇ) එ සේ යම් තැනැත්තන් විසින් නීති විරෝධී බාධා කිරීම්වලට යටත් කරන ලද ටැලිපෝන් පණිවුඩවල අඩංගු කරුණු ඔවුන් විසින් වෙනත් තැනැත්තන්හට එළිදරවු කරන ලද ප්‍රමාණය, සහ ඒ කරුණු එ සේ යම් තැනැත්තන් විසින් එළිදරවු කරන ලද්දේ ද ඒ තැනැත්තන්ගේ නම් සහ ඒ කරුණු එ සේ යම් තැනැත්තන්හට එළිදරවු කරන ලද්දේ ඒ තැනැත්තන්ගේ නම් ; සහ

(2) මහජන ශුභ සිද්ධිය තකා ඒ පණිවුඩවල අඩංගු කරුණු පිළිබඳ රහස්‍යතාව ආරක්ෂා කිරීමේ යෝග්‍යත්වය ගැන ද, විශේෂ වශයෙන්, (ටැලිපෝන් පණිවුඩවලට නීති විරෝධී බාධා කිරීම සහ ඒ පණිවුඩවල අඩංගු කරුණු එළිදරවු කිරීමත් සම්බන්ධයෙන් විදුලි සන්දේශ නිලධාරීන් විසින් හෝ වෙනත් රජයේ නිලධාරීන් විසින් හෝ මහජනයා විසින් සිදු කරනු ලබන වැරදි සඳහා වඩා නිවර්තක දඬුවම් සලස්වා දීම ඇතුළු ව) රජයේ ටැලිපෝන් සේවයට අදාළ වන නීතිය, ව්‍යවහාරය හා කාර්යපරිපාටිය ගැන ද සැලකිලිමත් ව, පරීක්ෂණයේ ප්‍රතිඵලයක් වශයෙන්, අනාගතයේ දී ටැලිපෝන් පණිවුඩ එබඳු නීති විරෝධී බාධා කිරීම්වලට යටත් කිරීම වැළැක්වීම සඳහා ඔබ විසින් අවශ්‍ය යයි සලකනු ලබන නිර්දේශයන් කිරීම ද වේ.

තවද ටැලිපෝන් පණිවුඩවලට නීති විරෝධී බාධා කිරීම ගැන හෝ එ සේ නීති විරෝධී බාධා කිරීම සාර්ථක කර ගැනීමෙහි ලා සහාය දීම, නිසොල්මන් ව ඉඩ හැරීම හෝ සහයෝගය දක්වීම ගැන හෝ එ සේ නීති විරෝධී ලෙස බාධා කරන ලද ටැලිපෝන් පණිවුඩවල අඩංගු කරුණු එළිදරවු කිරීම ගැන වරදකරුවන් යයි ඔබ විසින් නිශ්චය කොට ඇති විදුලි සන්දේශ නිලධාරීන්ට හෝ වෙනත් රජයේ නිලධාරීන්ට හෝ මහජනයාට විරුද්ධ ව ගත යුතු ක්‍රියා මාර්ගය මා වෙත නිර්දේශ කරන ලෙස එකී ජී. පී. තම්බයියා වන ඔබට මම මෙයින් නියම කරමි.

තවද පූර්වෝක්ත කරුණු හා වෙනත් සමාන කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය යයි ඔබට පෙනී යා හැකි සියලු පරීක්ෂණ පවත්වන ලෙසත්, සියලු විමර්ශන කරන ලෙසත් එකී ජී. පී. තම්බයියා වන ඔබට මම මෙයින් බලය පවරන අතර, ඒ සම්බන්ධයෙන් ඔබේ අත්සනින් යුත් වාර්තාවක් හැකි පමණ ඉක්මණින් මා වෙත එවන ලෙස ඔබට මෙයින් නියම කරමි.

තවද ඔබේ පරීක්ෂණවල හා විමර්ශනවල කාර්‍ය්‍යයන් සඳහා ඔබ විසින් සහාය හෝ තොරතුරු ඉල්ලා සිටිය හැකි

(අ) සියලු රජයේ නිලධාරීන් විසින් ; හා

(ආ) රජයේ නිලධාරීන් නොවන වෙනත් සියලු තැනැත්තන් විසින්

1537—— ආර් 9649—6,700 (65/10)

ඒ සඳහා නිසි පරිදි දිය හැකි සියලු සහාය දෙන ලෙසත් සියලු තොරතුරු සපයන ලෙසත් එකී සියලු රජයේ නිලධාරීන් හට මා නියම කර විධාන කරන අතර, රජයේ නිලධාරීන් නොවන එකී වෙනත් සියලු තැනැත්තන්ගෙන් එසේ කරන ලෙස මම මෙයින් ඉල්ලා සිටිමි.

මෙම නිවේදනයේ කාර්‍ය්‍යයන් සඳහා—

(අ) ටැලිපෝන් පණිවුඩයක් පිළිබඳ ව, " නීති විරෝධී බාධා කිරීම " යන පාඨයෙන්—

(අ) යම් ලිඛිත නීතියක් මගින් හෝ එය යටතේ පවරනු ලැබූ බලය ප්‍රකාර හැර අන් ලෙසකින් කරනු ලැබූ ; හෝ

(ආ) එලෙස පවරනු ලැබූ බලය ප්‍රකාර හැර අන් ලෙසකින් කරන ලද යි හැඟෙන

යම් ක්‍රියාවක හෝ දෙයක ආධාරයෙන් ඒ පණිවුඩයට කරන යම් බාධා කිරීමක් අදහස් වේ ; තව ද

(ආ) " විදුලි සන්දේශ නිලධරයා " යන පාඨයෙන් (192 වැනි අධිකාරය වන) විදුලි සන්දේශ ආඥාපනතේ අර්ථානුකූල ව යම් විදුලි සන්දේශ නිලධරයකු අදහස් වන අතර, කලින් සේවය කළ විදුලි සන්දේශ නිලධරයකු ද ඊට ඇතුළත් වේ.

මොන්ටේගු ජයවික්‍රම,
රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ කටයුතු
පිළිබඳ ඇමති.

1965 ඔක්තෝබර් මස 25 දින.

10–1184

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි " ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන් " හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි